වලිකාමම් උතුර ප්‍රාදේශිය සභාව

යාපනය දිස්ත්‍රික්කය

-------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

--------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම.

-------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 මාර්තු 20 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබූ අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 25 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2014 දෙසැම්බර් 19 දින සභාවේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදි.

1.2 මතය

----------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශ වලින් 2013 දෙසැම්බර් 31 දිනට වලිකාමම් උතුර ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳව අදහස් දැක්වීම.

---------------------------------------------

1.3.1 ගිණුම්කරණ ඌණතා.

--------------------------

(i.) ගිණුම් ප්‍රකාශවල නිරීක්ෂණය වූ ඌනතා වත්කම් සහ බැරකම් වශයෙන් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම | වත්කම් | | බැරකම් | |
|---|---|---|---|---|
| | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම |
| | | රු. | | රු. |
| අඩුවෙන් දැක්වීම් | 01 | 19,322 | 01 | 118,444 |
| වැඩියෙන් දැක්වීම් | - | - | 03 | 35,712 |
| අත්හැරීම් | - | - | 01 | 2,866,917 |

(ii) සභාව විසින් භාවිතා කෙරුණු අංක WPLG 3711 දරන වාහනයේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. ඒ හේතුවෙන් මෝටර් රථ ගිණුම අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිකම

#### විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් නොකිරිම

විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි නොමැතිකම නිසා රු.19,053,300 ක් වටිනාකමැති ගණුදෙනු විගණනයේදි සන්නිරික්ෂණය කළ නොහැකි විය.

### 1.3.3 අනුකූල නොවීම්

පහත සඳහන් නීති,රීති, රෙගුලාසි සහ කළමනාකාරිත්ව තීරණ වලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදි නිරික්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම් |
| --- | --- | --- |
| 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත | | |
| පරිච්ඡේදය V වගන්තිය 158(1) | - | රු.542,983 ක් වූ හිඟ වරිපනම් බදු ගෙවීම් පැහැර හැරි පුද්ගලයන්ට එරෙහිව ලේකම් විසින් වරෙන්තු නිකුත් කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි | | |
| අංක 571 | - | රු.121,571 ක් වූ කල් ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

## 2. මුල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මුල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශ වලට අනුව සභාවේ සමාලෝචිත වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.4,319 ක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු. 17,555 ක් විය.

### 2.2 මුල්‍ය පාලනය

අයවැය විධිමත්ව පිළියෙල නොකර තිබූ නිසා අයවැයගත ආදායම සහ තත්‍ය ආදායම අතර රු.12,995,470 ක වෙනසක් ද අයවැයගත වියදම සහ තත්‍ය වියදම අතර රු.23,855,706 ක වෙනසක් ද විගණනයේදි නිරික්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය

-----------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම

---------------------------------------------------------------------

සභාපති විසින් ඉදිරිපත් කරන ලද පරිදි ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තත්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම් |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 87 | 104 | 543 |
| (ii) බදු කුලි | 2,916 | 3,110 | - |
| (iii) බලපත්‍ර ගාස්තු | 3,331 | 4,334 | - |
| (iv) වෙනත් ආදායම් | 65,415 | 51,206 | 37,175 |

2.3.2 ආදායම් එකතු කිරිම

--------------------------

සමාලෝචිත වර්ෂයේ රු.612,758 ක් වු වරිපනම් , බදු සහ බදු කුලි අයකර ගැනිම සඳහා නෛතික හෝ වෙනත් ඵලදායි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.3.3 උසාවි දඩ මුදල්

--------------------

මල්ලාකම් උසාවිය විසින් නොයෙකුත් ආඥා පනතේ සමාලෝචිත වර්ෂයේ පනවන ලද රු.1,145,055 ක් වු ලැබිය යුතු දඩ මුදල් ආදායම් හෝ ලැබිය යුතු මුදල් ලෙස පෙන්වා නොතිබුණි.

2.3.4 මුද්දර ගාස්තු

-----------------

2006-2013 වර්ෂ සඳහා මුද්දර ගාස්තු රු.50,454,189 ක් දැක්වෙන ලැයිස්තුවක් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබී, ලැබිය යුතු ආදායම් ලෙස පෙන්නුම් කර තිබුණි. එනමුත් එම මුදල් අයකර ගැනිම සඳහා ඵලදායි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.3.5 අයවිය යුතු කාර්ය මණ්ඩල ණය

---------------------------------------

පෙර පාසැල් ගුරුවරියකගෙන් ලැබිය යුතු රු.11,287 ක් වූ හිඟ ණය මුදලක් අයකර ගැනිම සඳහා සමාලෝචිත වර්ෂය තුලදි ඵලදායි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

--------------------------------

2.4.1 අක්‍රිය භෞතික වත්කම්

---------------------------

සභාවට අයත් වාහන 4 ක් සමාලෝචිත වර්ෂය තුලදි අක්‍රියව සහා පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

2.4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------------

පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රජා මධ්‍යස්ථාන සඳහා ප්‍රදානය කළ රු.15,500 ක මුදලක් දෙන ලද කාර්ය සඳහා උපයෝගි කරගෙන නොතිබු අතර එය විවිධ ණයගැති ගිණුමට ඇතුලත් කර තිබුණි.

2.5 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------------

2.5.1 ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති

-------------------------------------

රු.1,226,426 ක් සඳහා වු පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙනවිත් තිබු ප්‍රාග්ධන ව්‍යාපෘති මෙම වාර්තාවේ දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

2.5.2 ප්‍රාග්ධන වැඩ

------------------

මාවිට්ටපුරම්, 10 වෙනි සැතපුම් කණුව ප්‍රාදේශිය සභා අරමුදලින් රු.1,316,325 වැය කර සමාලෝචිත වර්ෂයේ සිදුකළ ප්‍රාග්ධන වැඩ පිළිබඳව අයවැය ඇස්තමේන්තුවේ අනුමත කර නොතිබූ අතර ලේකම්ගේ අංක DS/VN/CUL/MAVI/TEM/2013 දරන අතිරේක ඇස්තමේන්තුව මගින් ක්‍රියාත්මක කර තිබුණි.

3. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය අවශ්‍ය වේ.

(අ) වරිපනම් හා බදු අයකිරීම

(ආ) දේපල තක්සේරුව

(ඇ) විවිධ තැන්පතු

(ඈ) විවිධ ණයගැතියන්